# බළන්ගොඩ නගර සභාව

## 2021-09-27 වන දිනැති මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.09.27**

**වේලාව - පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති එම්. ටී. එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්. ජුනයිදීන් මලික්ෂා මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රිනි | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.එස්.පී.ගලප්පත්ති මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 10. ගරු නාගරික මන්ත්‍රිනි | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 12. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රිනි | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 14. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්.එච්.ඒ.කරුණාරත්න මිය

**01. පසුගිය මහ සභා වාර්තාව සභා සම්මත කිරීම.**

මෙදින මහ සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ ගරු උප සභාපතිතුමා, සභාව සඳහා සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් ඇතුළු සියළුදෙනා පිළිගැනීමෙන් අනතුරුව 2021-08-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට සභා සම්මත කර ගන්නා ලෙස පවසා සිටින ලදී.

එහිදී ගරු නාගරික මන්ත්‍රී කේ. පී. ප්‍රේමදාස මැතිතුමා විසින් 2021-08-10 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍යය වාර්තාවක් බවට යෝජනා කළ අතර ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු උප සභාපතිතුමා විසින් මෙදින සභා වාර්තාවේ සංශෝධනයන් තිබේදැයි විමසූ අවස්ථාවේදී ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් පැවසූවේ (පිටු අංක 29) මන්ත්‍රී යෝජනා යටතේ "සුබයිර් අලීම් මාවත" යන්න "අලබ්දීන් මාවත" ලෙස සංශෝධනය විය යුතු බවයි.

**ඒ අනුව ඉහත සංශෝධනයන්ට යටත්ව සභා වාර්තාව ගරු සභාවේ සම්මත විය.**

**02. ගරු සභාපතිතුමන් විසින් කරනු ලබන නිවේදන**

- ගරු උප සභාපතිතුමා විසින් නිවේදන වාරය ආරම්භ කළ අතර, එහි දී ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා අසනීප තත්ත්වයෙන් පසුවෙන බැවින් අද දින මහ සභාව පවත්වාගෙන යාම සඳහා වැඩ බලන සභාපති වශයෙන් තමන් හට අවසර ලබා දුන් බව ද ගරු සභාපතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරන බව ද කාල කළමනාකරණයකින් යුතුව අද දින සභාව පවත්වාගෙන යාමට සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ද පවසන ලදී.
- එමෙන්ම බළන්ගොඩ නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමිපුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීතුමියගේ සහෝදරයාගේ අභාවය සම්බන්ධයෙන් ගරු සභාවේ සියලුම දෙනා වෙනුවෙන් ශෝකය මෙම අවස්ථාවේ ප්‍රකාශ කරන ලදී.

**03. සංදේශ / පැමිණිලි / පෙත්සම් / ආයාචනා ඉදිරිපත් කිරීම**

- ➢ බළන්ගොඩ පොදු වැසිකිළි ටෙන්ඩර්කරු විසින් අගෝස්තු සහ සැප්තැම්බර් මාස දෙකෙහි රට වසා තැබූ බැවින් පොදු වැසිකිළියේ නඩත්තු ගාස්තු සහ ජල බිල්පත් ගෙවීමට නොහැකි බව පවසමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු උප සභාපතිතුමා විසින් සභාගත කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසූවේ මුළු රටම වසා පවතින මෙම කාලයේ දී වෙනත් කවුරුන් හෝ ජලය භාවිත කර ඇති බැවින් ජල බිල්පත් ගෙවීමෙන් නිදහස් කර දෙන ලෙසයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින්, රටේ නිරෝධායන ඇඳිරි නීතිය පවතින කාලය තුළ ජල බිල්පත් ලැබීම ප්‍රශ්නයක් බව ද මෙම ජල සම්බන්ධතාවයෙන් කඩ කාමරවලට ද ජලය ලබා දී ඇති නිසා මෙසේ ජල බිල්පත් ලැබිය හැකි බැවින් මේ සම්බන්ධව සොයා බලන ලෙස ද පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ ජල බිල්පත් හා ගාස්තු ගැන කතා කිරීමට පෙර මෙම වැසිකිළි වෙත යාමට හැකි තත්ත්වයේ පවතිනවා ද යන්න සොයා බලන ලෙසයි. විශේෂයෙන් පොළ වැසිකිළිය තුළ මත්ද්‍රව්‍ය භාවිත කරන පිරිස් සිටින අතර අසභ්‍ය වචන නිරන්තරයෙන්ම ඇසෙන බවත් මේ සම්බන්ධව තමන් කිහිපවරක්ම ගරු සභාවට පැවසුව ද ප්‍රතිඵලයක් නොවූ බැවින් විශේෂ අවධානයක් යොමු කර ඉක්මන් පියවරක් ගන්නා ලෙසත් පවසන ලදී.

මෙම කාරණා සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**පෙ.ව 10.24 ට පමණ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

- බළන්ගොඩ, කල්තොට පාර, අංක 41/07 ලිපිනයේ ඩබ්. එම්. කේ. බණ්ඩාර යන අය විසින් ඇකඩමිය මාර්ගය හා අනෙකුත් මාර්ගයන්හි කසළ එක්රැස් කිරීමට පැමිණෙන්නන් අතර වයස අවුරුදු 12 ක් පමණ වන කුඩා දරුවන් ද සිටින අතර ඔවුන් නිවෙස්වල ගහකොළවලට මෙන්ම දේපලවලට ද හානි සිදු කරන බව ද මෙම ක්‍රියාකාරකම් සම්බන්ධව නිසි ක්‍රියාමාර්ග ගන්නා ලෙස ද පවසමින් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු උප සභාපතිතුමන් විසින් සභාගත කරන ලදී.

  මේ සම්බන්ධව සොයා බලා වයස අවුරුදු 16 ට අඩු දරුවන් යොදවා නොගන්නා ලෙසට අදාල කසළ ටෙන්ඩර්කරුව දැනුවත් කරන ලෙස ගරු උප සභාපතිතුමා පැවසීය.

- අසනීප තත්ත්වයක් හේතුවෙන් 2021-09-27 දින මහ සභාවට සහභාගී නොවන බවත්, නිවාඩු අනුමත කර දෙන ලෙසත්, ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් කරන ලද ඉල්ලීම ගරු උප සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලදුව නිවාඩු අනුමත කරන ලදී.

**04. ටෙන්ඩර්පත් හා මිළ ගණන් විවෘත කිරීම**

අද දින ටෙන්ඩර්පත් හා මිළ ගණන් ඉදිරිපත් වී නොමැති බව ගරු උප සභාපතිතුමන් විසින් පවසන ලදී.

**05. කල් දී ඇති ප්‍රශ්න**

**05:01 ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය**

05:01:01 මුගුණමලේ සුසාන භූමිය නගර සභාව වෙත පවරා ගැනීමේ වර්තමාන තත්ත්වය?

මුගුණමලේ සුසාන භූමිය බළන්ගොඩ නගර සභාවට පවරා ගැනීම වෙනුවෙන් අදාල ඉඩම් කොටස මැනුම් කිරීමට හා රේඛා චිත්‍ර ගාස්තු වශයෙන් රු. 11,514.60 ක මුදලට අදාල චෙක්පත 2021-04-27 වන දින රත්නපුර, ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරීතුමා වෙත යොමු කර ඇත.

**05:02 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

05:02:01 වත්මන් සභාව පත් වූ දා සිට අනවසර ඉදිකිරීම් සඳහා සභාව එය නතර කිරීම සඳහා යවන ලද නියෝග කොපමණ ඇත් ද?

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් සෑම ස්ථානයකම අනවසර ඉදිකිරීම් සිදු වන බවත්, උදාහරණයක් ලෙස චෙට්නෝල් පාරේ බරපතල ප්‍රශ්නයක් පවතින අතර, ගරු සභාපතිතුමා හා නිළධාරීන් පැමිණ අනවසර ඉදිකිරීම් සම්බන්ධව දැනුවත් කළ ද එම ඉදිකිරීම් නැවතී නැති බවත්, ලිඛිතව දැනුම් දුන්න ද ඉන්පසුව අවශ්‍ය නීතිමය පියවර අනුගමනය නොකිරීම මත මෙම අනවසර ඉදිකිරීම් දිගින් දිගටම සිදුවන බවත් පැවසීය.

මේ සම්බන්ධව කරුණු පැහැදිලි කිරීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**06. කල් දී ඇති යෝජනා**

**06:01 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා**

06:01:01 ගබඩා අවශ්‍යතා සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය මිළදී ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

| ද්‍රව්‍ය | ප්‍රමාණය |
|---|---|
| 10 × 15 ලියුම් කවර | 100 |
| A 4 බන්ඩල් | 50 |
| ග්ලවුස් පෙට්ටි | 10 |
| ඉදල් | 100 |
| ග්ලාස් ක්ලිනර් | බෝතල් 10 |
| Sanitizer 5L | කෑන් 10 |

| | |
|---|---|
| ලයිෆ්බෝයි | 1000 |
| 10 × 7 ලියුම් කවර | 100 |
| වර්ටකෝ මැසි නාශක | 05 |
| ක්ලෝරීන් බැරල් | 10 |
| එතනෝල් ලීටර් | 50 |
| මාස්ක් පෙට්ටි | 10 |
| ට්‍රැක්ටර් සඳහා හෝන් | 20 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි සඳහන් ද්‍රව්‍යවල ප්‍රමාණයන් සම්බන්ධව ගැටලුකාරී තත්ත්වයක් සභාව තුළ උද්ගත වූ අතර, කරුණු පැහැදිලි කර ගැනීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගබඩාවේ දැනට පවතින ලයිෆ්බෝයි ප්‍රමාණය අවසන් වීමට ආසන්න අවස්ථාව වන විට නැවත මිල දී ගැනීම සඳහා සභා අනුමැතියට ඉදිරිපත් කරන ලෙසටත්, අනෙකුත් ගබඩා අවශ්‍යතා අද දින අනුමත කිරීමට හැකි බවටත් ගරු උප සභාපතිතුමන් කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ02 2022 වර්ෂය සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ලැයිස්තුව හා දැන්වීම දිනමිණ හා තිණකරන් පුවත්පත්වල එකවරක් පළ කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | කාර්යාල උපකරණ හා ලිපි ද්‍රව්‍ය |
| 02. | වානේ ගෘහ භාණ්ඩ හා ලී බඩු |
| 03. | පරිගණක, පරිගණක උපාංග හා මුද්‍රණ තීන්ත, CD තැටි, ටෝනර්, කාර්ට්රිජ්, රිබන්, පරිගණක මෘදුකාංග |
| 04. | ගොඩනැගිලි ඉදිකිරීම් ද්‍රව්‍ය |
| 05. | මාර්ග නඩත්තු උපකරණ හා ද්‍රව්‍ය<br>6×9, 6×4, 4×4, 4×2, 2×2, 1 1/2, 1, 3/4, 1/2 ප්‍රමාණයේ කළුගල්, ගල් කුඩු, ABC, සියලුම ජල සැපයුම් පයිප්ප හා උපාංග, හියුම් පයිප්ප, කොන්ක්‍රීට් නිෂ්පාදන, ගංගා වැලි |
| 06. | නාම පුවරු, දැන්වීම් හා සමරු ඵලක, බැනර්, කටවුට්, ඩිජිටල් පෝස්ටර් ආදිය |
| 07. | ක්‍රීඩා භාණ්ඩ, ළදරු පාසල් උපකරණ |
| 08. | තීන්ත වර්ග ( එනමල්, ඉමල්ෂන්, මළ නිවාරණ තීන්ත) |
| 09. | විදුලි උපකරණ ( විදුලි පහන් ඇතුළු සියලු විදුලි අයිතමයන්) |
| 10. | මුද්‍රණ කටයුතු හා රබර් මුද්‍රා නිෂ්පාදන, මුද්‍රිත පෝරම |
| 11. | කාර්යාල උපකරණ අලුත්වැඩියාව (යතුරුලියන, ඡායා පිටපත් යන්ත්‍ර, රෝනියෝ යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර, වේලා සටහන් යන්ත්‍ර, පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ආදී අනිකුත් යන්ත්‍ර |
| 12. | වාහන සේවා/අලුත්වැඩියා, වාහන අමතර කොටස් (ටයර්, ටියුබ්, බැටරි ඇතුළු අනෙකුත් අමතර කොටස්) |
| 13. | කුලී පදනම මත ගල් වැලි ප්‍රවාහනය සඳහා ටිපර් රථ සැපයීම. |
| 14. | සෞඛ්‍යය උපකරණ හා විෂබීජ නාශක ද්‍රව්‍ය (සබන්, කුණු ඉවත් කිරීමේ ද්‍රව්‍ය) |
| 15. | පිඟන් භාණ්ඩ |
| 16. | පුස්තකාල පොත් |
| 17. | නිළ ඇඳුම් සඳහා රෙදි සැපයීම. |
| 18. | ශ්‍රව්‍ය උපකරණ, දෘශ්‍ය උපකරණ, පටිගත කිරීම් උපකරණ ආදිය සැපයීම. |
| 19. | පරිභෝජන භාණ්ඩ, වියළි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය සැපයීම. |
| 20 | ඉහත සඳහන් නොවුණු වෙනත් අයිතමයන් (සඳහන් කරන්න) |

**කොන්ත්‍රාත්කරුවන්**

| අනු අංකය | කාණ්ඩය |
|---|---|
| 01. | රු. 100,000/- දක්වා |
| 02. | රු. 100,000/- සිට 250,000 දක්වා |
| 03. | රු. 250,000 සිට රු. 500,000/- දක්වා |
| 04. | රු. 500,000/- සිට 1,000,000 දක්වා |
| 05. | රු. 1,000,000/- ට වැඩි |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ03 2021 සැප්තැම්බර් මාසය සඳහා කාර්යසාධන ණය රු. 800,000.00 කට යටත්ව ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඞී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:04 කාර්යසාධන ණය පියවීම සඳහා වැඩිපුර අය වී ඇති වාරික මුදල් වන රු. 11,827.95 ක මුදල නැවත තිහානි අමන්තා ප්‍රනාන්දු මෙය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ05 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා පූර්ව අනුමැතිය ලබා ගැනීම.

i. කරව්කැටිය ගල්වල පාර පාලම ඇදි සකස් කිරීම සඳහා (1 1/2 " X 1 1/2") GI Heavy පයිප්ප හා අනෙකුත් ද්‍රව්‍ය මිල දී ගැනීම වෙනුවෙන් පී. එම්. කේ හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 46,070.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම ( බිල් අංක 901 හා 905)

ii. ගබඩා අවශ්‍යතා සඳහා ලිපි ද්‍රව්‍ය හා සෞඛ්‍ය අංශය සඳහා අවශ්‍ය ද්‍රව්‍ය (ඉදල්, විම් කැට) මිල දී ගැනීම වෙනුවෙන් ජෝති ස්ටෝර්ස් වෙත රු. 16,600.00 ක මුදලක් ගෙවීමට සභා අනුමැතිය ලබා ගැනීම ( බිල් අංක 59414)

iii. කර්මාන්ත අංශයේ ප්‍රයෝජනය සඳහා සිමෙන්ති (සංස්ථා) ඇතුළු ප්ලේට් සැදීම සඳහා කටින් වීල් මිලදී ගැනීම වෙනුවෙන් පී. එම්. කේ හාඩ්වෙයාර් ආයතනය වෙත රු. 45,500.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම ( බිල් අංක 912 හා 907)

iv. 227-5020 අංක දරණ ගලි බවුසරය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ. ඉංජිනියරින් ආයතනය වෙත රු.17,950.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

v. 56-1906 අංක දරණ කෘෘ කැබ් රථය පූර්ණ සේවා කිරීම වෙනුවෙන් කේ.ඒ. ඉංජිනියරින් ආයතනය වෙත රු.11,910.00ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:06 රු.10,000.00 ට වැඩි ගෙවීම් සඳහා ආවරණ අනුමැතිය ලබා ගැනීම.

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක්පත් අංකය | මුදල රු. |
|---|---|---|---|---|
| 2021-08-09 | දෛනික වැටුප් | 52, 55, 56,57, 62 | 066768 | 275,562.02 |
| 2021-08-16 | බී.විනෝදනී ප්‍රේමිකා - 2021-08-01 සිට 2021-08-15 දක්වා කසළ ඉවත් කිරීම වෙනුවෙන් ගෙවීම | 84 | 066803 | 320,025.00 |
| 2021-08-16 | ලංකා විදුලි බල මණ්ඩලය - විදුලි බිල්පත් ගෙවීම (බැංකියවත්ත) | 85 | 066804 | 26,763.40 |
| 2021-08-18 | එම්. එස්. එම්. රිස්වාන් - ඇප තැන්පත් ගෙවීම (පොදු වෙළඳසැල අංක 17 කඩකාමරය ටෙන්ඩර් කිරීමේ දී තැන්පත් කරන ලද ඇප තැන්පත්) | 88 | 066807 | 10,000.00 |
| 2021-08-18 | ජේ. එම්. ඉලායස්, ඇප තැන්පත් ගෙවීම (පොදු වෙළඳසැල අංක 17 කඩකාමරය ටෙන්ඩර් කිරීමේ දී තැන්පත් කරන ලද ඇප තැන්පත්) | 89 | 066808 | 10,000.00 |
| 2021-08-19 | බී.කේ. ජේ. එස්. අමරදාස - ඉන්ධන බිල්පත් පියවීම | 94 | 066812 | 184,258.34 |
| 2021-08-19 | සී/ස ඉඹුල්පේ වි.සේ.ස.සමිතිය - ඉන්ධන බිල්පත් පියවීම | 95,96, 97 | 066813 | 211,037.16 |
| 2021-08-20 | බල/එකමුතු පුරවැසි සංවිධානය - (දෙහිගස්තලාව මුස්ලිම් පල්ලියේ මායිම් තාප්පය ඉදි කිරීමේ කර්මාන්තය අවසන් කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම) | 102 | 066815 | 274,000.00 |
| 2021-08-24 | සුභ සරණ පුරවැසි සමිතිය - (ගලපල්ලෙඅරාව කොළණිය මාර්ගයේ පැති බැම්ම ඉදි කිරීම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම වෙනුවෙන් අදාල මුදල් ගෙවීම) | 108 | 066849 | 143,238.89 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා, දෙහිගස්තලාව මුස්ලිම් පල්ලියේ මායිම් තාප්පය ඉදි කිරීමට අදාල ගාස්තු ගෙවීම සඳහා අනුමැතිය ලැබී ඇත්දැයි විමසන ලදී.

ගරු උප සභාපතිතුමා පිළිතුරු ලබා දෙමින් මේ සඳහා අනුමැතිය ලැබී ඇති බව පවසන ලදී.

නැවත අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා යම් කිසි සංවර්ධන කටයුත්තක් සිදු කිරීමේ දී ලැබෙන මුදල පිළිබඳවත් කොන්ත්‍රාත්කරු පිළිබඳවත් සභාව දැනුවත් කළ යුතු බව ද එසේ කිසිදු දැනුවත් කිරීමක් නොමැතිව අදාල කාර්යය අවසානයේ මුදල් ගෙවීමට කටයුතු කරන බව ද කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රමවේදයේ වැරැද්දක් පවතින අතර එකම සමිතියකට හෝ කොන්ත්‍රාත්කරුවෙකුට ලබා දීම වැරදි බව ද පවසන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් තමන් සඳහා වෙන් වූ සභා අරමුදල් මගින් මෙම කාර්යය සිදු කළ අතර එම මුදල් ප්‍රතිපාදන සෑම නාගරික මන්ත්‍රීවරයෙකුටම ලැබුණු බව ද සභාවට යෝජනාව ඉදිරිපත් කර සම්මත වූ පසු සිදු කළ නමුත් මුදල් ගෙවීමේ දී මෙම ගැටලුව මතු වූ බව ද පැවසීය. එමෙන්ම සභා අරමුදල් ආගමික

ස්ථානවලට යෙදවීමට නොහැකි බව මුලදීම දැනුම් දුන්නේ නම් තමන් වෙනත් ව්‍යාපෘතියකට එම මුදල් යොදවන  බව ද වැඩිදුරටත් පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසුවේ සංවර්ධන යෝජනාවක් ලෙස ඉදිරිපත් කරන්නේ නම් සභාවේ එය අනුමත කරන බව ද මෙහි දී සිදුව ඇත්තේ සංවර්ධන යෝජනාවේ නමෙහි ප්‍රශ්නයක් බව ද අදාල නිළධාරීන් යෝජනාව සඳහා නම යෙදුව ද එය ඔවුන් හිතා මතා කළ දෙයක් නොවන බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:07 2021 ඔක්තෝම්බර් මස සභාවේ ගරු සභිකරුන්ගේ දීමනාව ලෙස රු.270,000.00 ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ් විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:08 2021-08-10 දින සිට ඔක්තෝම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සෞඛ්‍ය සේවා සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු. 43,720.00 ක මුදල  සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:09 2021 ඔක්තෝම්බර් මස සභාවේ නිළධාරීන්ගේ අතිකාල හා ගමන් වියදම් ඇස්තමේන්තුව සඳහා රු300,000.00 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:10 2021-08-10 දින සිට ඔක්තෝම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ සංග්‍රහ වියදම් ලෙස රු.50,000.00 ක මුදලක් වියදම් දැරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රිනී තරංගනී සමරසේකර මැතිතුමිය, පසුගිය මාසයේ වියදම් සම්බන්ධව සභාව දැනුවත් කිරීම සුදුසු බව පවසන ලදී.

ගරු උප සභාපතිතුමන් අදහස් දක්වමින් ඉදිරි සභාවාරයන්හි දී සභාව පැවැත්වෙන මාසයට පෙර මාසයේ වියදම් පිළිබඳව සභාව දැනුවත් කිරීමෙන් මාසික වියදම සම්බන්ධව දළ අදහසක් ලබා ගැනීමට හැකි බව පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ11 2021-08-10 දින සිට 2021 ඔක්තෝම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි වාහන අලුත්වැඩියා කටයුතු සඳහා රු.300,000.00 මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06ඃ01ඃ12 2021-08-10 දින සිට 2021 ඔක්තෝම්බර් මස සභාව පැවැත්වෙන දින දක්වා සභාවේ හදිසි යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා රු.75,000.00 ක මුදලක් වියදම් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:13 2021 ඔක්තෝම්බර් මස ගෙවිය යුතු දේශීය ණය සහ සංවර්ධන අරමුදල මගින් බස්නැවතුම්පල සහිත වෙළෙඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ලබා ගත් ණය වාරිකය ලෙස රු.769,680.36 මුදලක් ද, වැසි ජල කාණු පද්ධතිය ඉදි කිරීම වෙනුවෙන් ලබා ගත් ණය වාරිකය ලෙස රු.202,918.84 ක මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම.

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:14 ඉඩම්, පළාත් වාරිමාර්ග, කෘෂිකර්ම, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය විසින් නගර සභා බල ප්‍රදේශයේ මිරිදිය මත්ස්‍ය අලෙවිසැලක් ස්ථාපිත කිරීමට සුදුසු ස්ථානයක් හා මිරිදිය මත්ස්‍ය කර්මාන්තයේ යෙදීම සඳහා මාළු පෙට්ටි අවශ්‍ය අයගේ තොරතුරු ඇතුලත් විස්තරයක් එවන ලෙසට දන්වා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී මිරිදිය මත්ස්‍ය අලෙවිසැලක් ස්ථාපිත කිරීම සඳහා පොදු වෙළඳසැලේ ස්ථානයක් ලබා දීම සුදුසු බව සභාවේ මතය විය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:15 සුදර්ශනපුර ප්‍රජා ශාලාව සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් පහත ද්‍රව්‍ය මිල දී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| 1/2" PVC නල | 04 |
| 1/2" PVC Socekt | 03 |
| 1/2" PVC Get Val | 02 |
| 1/2" V/ Socekt | 04 |
| 1/2" Thred Seal | 02 |
| 1/2" PVC L Bore | 06 |
| 1/2" PVC End Cap | 01 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:16 බස්නැවතුම්පළේ මුර කුටිය සඳහා ජල සම්බන්ධතාවය ලබා ගැනීම වෙනුවෙන් පහත ද්‍රව්‍ය මිල දී ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| 1/2" PVC නල | 06 |
| 1/2" PVC Tee | 01 |
| 1/2" PVC L Bore | 06 |
| 1" PVC නල | 04 |
| 1" PVC L Bore | 04 |
| 1/2" PVC වැල් | 01 |

| | |
|---|---|
| 1/2" V/ Socekt | 03 |
| 1/2" Flexible Hose | 01 |
| 1 ½ Magic Hose | 01 |
| 1 1/2" x 1" R/ Socekt | 01 |
| Small Sink | 01 |
| 1 1/2" Concreat Nail | 20 |
| 1/2" GI Clip | 08 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:17 බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාසය තුළ COVID 19 එන්නත්කරණ කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් බළන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:18 බළන්ගොඩ නගරය පවිත්‍ර කිරීමේ ටෙන්ඩරය 2021-10-31 දිනෙන් අවසන් වන බැවින් නැවත ටෙන්ඩර් කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:19 ZA 5039 ෆෝටෝන් රථයේ එන්ජිම පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම හා (30/2016 චක්‍රලේඛය අනුව) එම යන්ත්‍රය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති මිල ගණන් සහ රේඩියේටරයක් මිල දී ගැනීම සඳහා මිල ගණන් අනුමත කර ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

ZA 5039 ෆෝටෝන් රථයේ සිසිලන පද්ධතියෙහි සිදු කිරීමට ඇති අලුත්වැඩියාව අභ්‍යන්තර අලුත්වැඩියාවක් බැවින් 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය (රජයේ වාහන නඩත්තු කිරීම) අනුව එම යන්ත්‍රය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ලබා දී ඇති ඇස්තමේන්තුවට අදාලව ෆෑන් බෙල්ට් එක අලුත්වැඩියාව, A/C බෙල්ට් එක දැමීම, රේඩියේටරය සවි කිරීම හා බකට් එක පැස්සීම යන අලුත්වැඩියාවන් සඳහා රුපියල් හතළිස් තුන්දහස්

හයසීයක (රු. 43,600.00) මිල යටතේ තෙබුවන ගරාජය වෙතින්ම සිදු කිරීම සුදුසු බවට ගරු උප සභාපතිතුමන් පවසන ලදී.

එමෙන්ම එම යන්ත්‍රය සඳහා අවශ්‍ය රේඩියේටරයක් ලබා ගැනීමට අදාලව ඇවන්ස්මාර්ට් ඉංජිනියරියන් ආයතනයෙන් සහ බ්‍රවුන්ස් තර්මල් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් මිල ගණන් ලැබී තිබූ බවද ඒ අනුව ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් වෙතින් රුපියල් 256,695.48 ක (රුපියල් දෙලක්ෂ පනස් හය දහස් හයසිය අනූ පහයි ශත හතළිස් අටක) මිල ගණනක්ද ,බ්‍රවුන්ස් තර්මල් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් රුපියල් 210,000.00 ක (රුපියල් දෙලක්ෂ දස දහසක) මිල ගණනක්ද ඉදිරිපත් වූ අතර, ලැබී ඇති අවම මිල යටතේ වසරක වගකීමක් සහිතව හා අලුත්වැඩියා කල හැකි ආකාරයේ රේඩියේටරයක් සඳහා බ්‍රවුන්ස් තර්මල් ඉංජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් වෙතින් ඉදිරිපත් කර ඇති රුපියල් 210,000.00 ක මිළ ගණන යටතේ (රේඩියේටරයක, ඔයිල් කූලර්) මෙම රේඩියේටරය ලබා ගැනීම සුදුසු බව සභාවේ මතය වූ බැවින් එය සුදුසු බවට ගරු උප සභාපතිතුමන් පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:20 ZA 9835 ගලි බවුසරයේ කොම්ප්‍රෙෂරය හා තිරිංග පද්ධතිය පරීක්ෂා කර අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:21 **227- 5020** ගලි බවුසරයේ ගියර් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා ( රජයේ වාහන නඩත්තු කිරීම 30/2016 චක්‍රලේඛය අනුව) එම ගලි බවුසරයේ ගියර් පෙට්ටිය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව අනුමත කර ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**227- 5020** ගලි බවුසරයේ ගියර් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා ( රජයේ වාහන නඩත්තු කිරීම 30/2016 චක්‍රලේඛය අනුව) අභ්‍යන්තර වාහන අලුත්වැඩියාවක් බැවින් ගරාජයකට යොමු කර එම ගරාජයෙන්ම ඇස්තමේන්තුවක් ලබා ගන්නා ලද අතර, ඒ අනුව එම ගලි බවුසරයේ ගියර් පෙට්ටිය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුවට අදාලව පවතින ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සඳහා වගකීමක් ලබා දීමට නොහැකි බැවින් මේ සඳහා ISUZU වර්ගයේ මෙම වාහන මාදිලියේ නැවත සකස් කරන ලද (රීකන්ඩිෂන්) ගියර් පෙට්ටියක් තැබීමට වගකීමක් සහිතව රුපියල් 162,350.00 ක (රුපියල් එක් ලක්ෂ හැට දෙදහස් තුන්සිය පනහක) ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර ඇති බව ද ඩිපෝ ඉංජිනේරු විසින් ලබා දී ඇති වාර්තාවට අනුව ද පවතින ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සුදුසු නොවන බැවින් නැවත සකස් කරන ලද ගියර් පෙට්ටියක් තැබීම සුදුසු බව සඳහන් කර ඇති බව ද ගරු උප සභාපතිතුමා පවසන ලදී.

ඒ අනුව තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කළ ඇස්තමේන්තුව සලකා බලා පවතින ගියර් පෙට්ටිය අලුත්වැඩියා කිරීම සුදුසු නොමැති බැවින් ISUZU වර්ගයේ මෙම වාහන මාදිලියේ

නැවත සකස් කරන ලද (රීකන්ඩිෂන්) ගියර් පෙට්ටියක් තැබීම සුදුසු බව සභාවේ තීරණය වූ අතර, ඉහත ගියර් පෙට්ටිය ගලවා පරීක්ෂා කර බැලූ තෙබුවන ගරාජය වෙතින් ඉදිරිපත් කර ඇති ISUZU වර්ගයේ මෙම වාහන මාදිලියේ නැවත සකස් කරන ලද (රීකන්ඩිෂන්) ගියර් පෙට්ටියක් තැබීම සඳහා වන රුපියල් 162,350.00 ක (රුපියල් එක් ලක්ෂ හැට දෙදහස් තුන්සිය පනහක) ඇස්තමේන්තු මුදල යටතේ මෙම අලුත් වැඩියා කිරිම සුදුසු බව ද මෙම ගලි බවුසරය ගලි ප්‍රවාහන කටයුතු සඳහා දෛනිකව අත්‍යවශ්‍ය වන වාහනයක් බැවින් මෙම ගලි බවුසරයේ අලුත්වැඩියා කටයුතු කඩිනමින් සිදු කළ යුතු බව ද සභාවේ මතය වූ බැවින් එය සුදුසු බවට ගරු උප සභාපතිතුමන් පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:22 2013-09-09 දින ගිවිසුම් අවලංගු කර දේපල නැවත පවරා ගැනීමට කටයුතු කිරීම නිසා අසාධාරණයට ලක් වූ බළන්ගොඩ පොදු වෙළඳසැල පිටුපස වෙළඳාම් කටයුතුවල නිරත වූ කඩ හිමියන් සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සාකච්ඡා කර ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා පැවසුවේ එම කඩ හිමියන් වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට වෙනත් ස්ථානයක් දීමට හැකියාවක් ඇත්නම් විරුද්ධත්වයක් නොමැති බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා තමන්ගේ අදහස එසේ පැවසුව ද ගිවිසුම අනුව එම අවස්ථාවේ දී හිටපු ගරු සභාපතිතුමා නිවැරදිව හා නීත්‍යානුකූලව අවශ්‍ය කටයුතු සිදු කර ඇති බව පවසන ලදී.

ඒ අනුව ගිවිසුම ප්‍රකාරව නීත්‍යානුකූලව දේපල නැවත පවරා ගැනීමට කටයුතු කිරීම නිසා බළන්ගොඩ පොදු වෙළඳසැල පිටුපස වෙළඳාම් කටයුතුවල නිරත වූ කඩ හිමියන් සම්බන්ධව සභාවේ බැඳීමක් නොමැති බවට ගරු උප සභාපතිතුමන් යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා එය ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:23 සභාව සතු වාහනවල රක්ෂණ කාලය 2021-12-24 දිනෙන් අවසන් වන බැවින් ඉදිරි වසරක කාලය සඳහා එම වාහන රක්ෂණය කිරීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:24 44 -7142 අංක දරණ ට්‍රේලරය අලුත්වැඩියා කිරීම සඳහා සහා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:25 PF 4006 කැබ් රථයේ ක්ලච් පද්ධතිය හා බ්‍රේක් පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:26 226-7521 ටිපර් රථයේ යතුරු ස්විචය සහ වම්පස වීදුරුව උස් පහත් කරන ස්විචයේ මෝටරය යොදා අලුත්වැඩියා කිරීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:27 HF 8558 ට්‍රැක්ටර් රථය සඳහා 90 Amp බැටරියක් ලබා ගැනීමට සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:28 නාගරික සංවර්ධන අධිකාරිය විසින් බළන්ගොඩ ඇවිදින මංතීරු ව්‍යාපෘති භූමියේ පවතින කුණු සහිත පස් ඉවත් කර දෙන ලෙස ඉල්ලා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඇවිදින මංතීරු ව්‍යාපෘතිය ඇස්තමේන්තු කිරීමේ දී ඒ තුල ව්‍යාපෘති භූමියේ පවතින කුණු සහිත පස් ඉවත් කිරීම අන්තර්ගත කර නොමැති බැවින් බළන්ගොඩ නගර සභාව විසින් එය ඉටු කර දෙන ලෙසට ලිපියක් මඟින් ඉල්ලා ඇති බව පැවසීය.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා පැවසුවේ මාර්ගය සෑදීමේ දී මැද කොටසෙහි මෙම පස් සහිත ස්ථානය පවතින අතර, සභාවේ බැකෝ යන්ත්‍රය යොදා ඉවත් කළහොත් පැය කීපයකින් අවසන් කළ හැකි බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:29 2021 සැප්තැම්බර් මස සහ ඔක්තෝම්බර් මස කර්මාන්ත අංශයේ නඩත්තු සඳහා ද්‍රව්‍ය වෙනුවෙන් සභා අනුමැතිය ලබා ගැනීම

| ද්‍රව්‍ය | අවශ්‍ය ප්‍රමාණය |
|---|---|
| චිප් ගල් (කියුබ්) | 08 |
| 3/4 ගල් (කියුබ්) | 08 |
| 1 1/2 ගල් (කියුබ්) | 12 |
| ABC (කියුබ්) | 10 |
| සිමෙන්ති බෑග් | 35 |

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා විමසා සිටියේ මෙම ද්‍රව්‍ය අවශ්‍ය කරන අපේක්ෂිත කර්මාන්ත මොනවාද? යන්නයි.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

අනතුරුව ගරු උප සභාපතිතුමා පැවසුවේ කර්මාන්ත කමිටුව පැවැත්වෙන දිනයේ දී පෙර මාසයේ වැඩ අවසන් කළ කර්මාන්ත පිළිබඳව පැහැදිලි කරන ලෙසත්, සෑම මාසයකම පවතින තොගය පිළිබඳ විස්තර මහ සභාවට ඉදිරිපත් කරන ලෙසත් ය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:30 ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත මාර්ගස්ථ මුදල් රක්ෂණය සඳහා රු. 54,730.00 ක් හා විදුලි කාර්මික රක්ෂණය සඳහා රු. 12,281.00 ක් වශයෙන් රක්ෂණ වාරික ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**පෙ.ව 11.30 ට පමණ ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා සභාවට පැමිණෙන ලදී.**

06:01:31 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් බළන්ගොඩ වීරසුන්දරාරාම මාර්ගයේ ජල නල කාන්දුවක් පිළිසකර කර ගැනීම සඳහා මාර්ගය පළුදු කිරීමට අවශ්‍ය බව පවසා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් මෙම ස්ථානයේ දිග අඩි 20 ක් පමණ වන ලොකු ප්‍රදේශයක් මේ වන විටත් අක්‍රමවත් ලෙස කඩා දමා ඇති අතර, ඒ ආසන්නයේ තවත් ගිලා බැසීමක් පවතින බව පවසන ලදී.

මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු පැහැදිලි කර ගැනීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව පළුදු වූ මාර්ග කොටස කාපට් ඇතිරීමට සුදුසු වන පරිදි ABC මිශ්‍රණය යොදා යථා පරිදි සනවත් කර සභාවට භාර දෙන ලෙස ජල සම්පාදන මණ්ඩලයට ලිපියක් මඟින් දැනුම් දීම සුදුසු බව ගරු උප සභාපතිතුමා පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

06:01:32 ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සුදර්ශනපුර ප්‍රජා ශාලාව අසල දක්වා මාර්ග උරහිස දිගේ අඩි 01 ක් පළල හා මීටර 50ක් දිග කාණුවක් කැපීමට හා ජල නලය (2”) සම්බන්ධ කරන ස්ථානයේ මාර්ග තලය වර්ග අඩි 3ක් පමණ පළුදු කිරීමට අවශ්‍ය බව පවසා ඇති අතර, ඒ සඳහා සභා අනුමැතිය ලබා ගැනීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී ගරු උප සභාපතිතුමා පැවසුවේ වැඩ අධිකාරීතුමා විසින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව අවසර ලබා දීමට හැකි බවයි.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07. මන්ත්‍රී යෝජනා**

**07:01 ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී ගුණරත්න මැතිතුමා**

07:01:01 වත්මන් සභාව පත් වූ දා සිට අනවසර ඉදිකිරීම් නතර කිරීම සඳහා යවන ලද නියෝගවල පිටපත් අපට දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලෙස යෝජනා කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සම්බන්ධව කල් දී ඇති ප්‍රශ්න යටතේ සාකච්ඡා වූ බව ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පවසන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:02 ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී සමරසේකර මැතිතුමිය**

07:02:01 මුගුණමලේ මාර්ගයේ කාණු පද්ධතිය සහ මාර්ගය නඩත්තු කිරීම

07:02:02 අනඳමෙත්ගම මාර්ගයේ පළමු වන පටුමග සහ තුන්වන පටුමග කාණු පද්ධතිය හා මාර්ගය නඩත්තු කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:03 ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

07:03:01 සභාවේ දැනට ඇති මුදල්වලින් කොට්ඨාසයේ සංවර්ධනය සඳහා එක් මන්ත්‍රී කෙනෙකුට ලක්ෂ 20 ක් ලබා දෙන ලෙස ඉල්ලීම

07:03:02 උඩකන්ද මාර්ගයේ කාණු දෙපස සකස් කර දෙන ලෙස ඉල්ලීම

ඉහත සඳහන් යෝජනා ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රිනි තරංගනී සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී

මෙහි සඳහන් උඩකන්ද මාර්ගයේ කාණු සකස් කිරීම අවසන් අදියරේ පවතින බැවින් ඒ සම්බන්ධව ගරු සභාපතිතුමාට හා අදාල නිළධාරීන්ට ස්තුතිවන්ත වන බව ද කාණු නොමැති තවත් කොටසක් පවතින අතර, එය සකස් කර දීමට හැකි නම් මාර්ගය සේදී යාමෙන් වළක්වා ගත හැකි බව ද පවසන ලදී.

එමෙන්ම සභාවේ දැනට ඇති මුදල්වලින් කොට්ඨාසයේ සංවර්ධනය සඳහා එක් මන්ත්‍රී කෙනෙකුට ලක්ෂ 20 ක් ලබා දෙන ලෙස තමන් ඉල්ලීමක් සිදු කළේ සියලුම ගරු නාගරික මන්ත්‍රීවරුන් වෙනුවෙන්ම බව ද විශේෂයෙන් අවුරුදු ගණනාවක සිට උඩකන්ද පාර සංවර්ධනය කිරීමට අපේක්ෂාවෙන් සිටිය නමුත් එය ඉටු නොවූ බව ද කාපට් කරන බව පැවසුව ද පාරේ පිහිටීම මත එය කළ නොහැකි බව ද නඩත්තු කටයුතු සිදු කිරීමෙන් පසුව මාර්ගය පළල් වූ අතර, ඒ සමගම මාර්ගය සංවර්ධනය කිරීමට හැකි වූවා නම් උඩකන්ද මාර්ගයේ ප්‍රශ්නය අවසන් කර ගත හැකි බව ද ඒ සඳහා සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙස ද පවසන ලදී.

මෙහි දී මෙම යෝජනාව සංවර්ධන යෝජනාවක් වන බැවින් ක්‍රියාත්මක කළ නොහැකි බව ගරු උප සභාපතිතුමා පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, යෝජනාවක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව නැවත ඉදිරිපත් කිරීමට කොපමණ කාලයක් අවශ්‍ය ද යන්න විමසා සිටි අතර, මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු උප සභාපතිතුමා පැවසුවේ ඒ සඳහා මාස 06 ක් අවශ්‍ය බවයි.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, ජනතාවගේ ඡන්දයෙන් තේරී පත්ව සභාවට පැමිණියේ ජනතාව වෙත සංවර්ධන රැගෙන යාමට බැවින් ඒ සඳහා වියදම් කිරීමට නොහැකි ඇයි? අධිකරණයේ පැවති නඩුව විසඳුනා නේදැයි විමසා සිටින ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු උප සභාපතිතුමා, 2020 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලැබී නොමැති බව ද අධිකරණයේ පිළිතුර මේ වන තෙක් ලැබී නොමැති අතර, ගරු ආණ්ඩුකාරතුමා විසින් කිසිදු සංවර්ධන කටයුත්තක් සභා අනුමැතියකින් තොරව සිදු කිරීමට නොහැකි බවට ලිඛිතව දැනුම් දී ඇති බව ද පැවසීය.

නැවත අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, සංවර්ධන කටයුතු සභා අනුමැතියකින් කළ හැකි නම් නොකර සිටින්නේ ඇයි දැයි විමසන ලදී.

මෙහි දී ගරු උප සභාපතිතුමා පැවසුවේ සභා සම්මත කර ගැනීමෙන් අනතුරුව ගරු ආණ්ඩුකාරතුමාට යොමු කර එතුමාගෙන් පිළිතුර ලබා ගත යුතු බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් මන්ත්‍රී යෝජනා යටතේ ඉදිරිපත් කර ඇත්තේ යෝජනාවක් නොව ඉල්ලීමක් බැවින් ප්‍රතික්ෂේප කරන ලෙස පවසන ලදී.

මේ සම්බන්ධව සිදු වූ දීර්ඝ සාකච්ඡාවෙන් අනතුරුව ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය විසින් මන්ත්‍රී යෝජනා යටතේ ඉදිරිපත් කර ඇති සභාවේ දැනට ඇති මුදල්වලින් කොට්ඨාසයේ සංවර්ධනය සඳහා එක් මන්ත්‍රී කෙනෙකුට ලක්ෂ 20 ක් ලබා දෙන

ලෙස කරන ලද ඉල්ලීම න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම පිළිගන්නවා ද ප්‍රතික්ෂේප කරනවා ද යන්න පිළිබඳව ඡන්දයක් පළමුව විමසීමට සිදු වන බැවින් ඒ සඳහා ඡන්දයක් විමසන ලදී.

එහිදී 07:03:01 ඉල්ලීම පිළිගැනීමට පක්ෂව ගරු සභිකවරුන් පස් දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රිනී | තරංගනී සමරසේකර මැතිතුමිය |
| 05. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය ද |

ඒ සඳහා පිළිගැනීමට විපක්ෂව ගරු සභිකවරුන් අට දෙනෙකුද, එනම්,

| | |
|---|---|
| 01. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.ඩබ්.පී.ගුණරත්න මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 06. ගරු නාගරික මන්ත්‍රීනී | ජී.චන්ද්‍රලතා මැතිතුමිය |
| 07. ගරු නාගරික මන්ත්‍රීනී | එම්.ජී.ශාන්තිලේඛා මැතිතුමිය |
| 08. ගරු නාගරික මන්ත්‍රීනී | මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ද |

ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටි ගරු සභිකවරුන් දෙදෙනෙකු ද එනම්,

| | |
|---|---|
| 01. ගරු උප සභාපති | එම්. ටී. එම්. රුෑමි මැතිතුමා |
| 02. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා ද |

ඡන්දය ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති චමික ජයමිණ විමලසේන මැතිතුමා සහ ගරු නාගරික මන්ත්‍රී ඊ.ඒ.ජේ. ප්‍රේමකුමාර මැතිතුමා මෙදින සභාවට නොපැමිණි ගරු සභිකයන් වේ.

ඒ අනුව 07:03:01 ඉල්ලීම න්‍යාය පත්‍රයට ඇතුලත් කිරීම වැඩි ඡන්ද තුනකින් පරාජයට පත් වූ බැවින් සභා සම්මත නොවීය.

මෙහි දී අදහස් දක් වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අපගේ දේශපාලන න්‍යාය පත්‍රය වෙනස් වුව ද අප සියලුදෙනා සමාජ කටයුතුවල දී එකට සිටින පිරිසක් බව ද එම නිසා ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් සංවර්ධන කටයුතු සිදු කිරීම සඳහා කොට්ඨාස ජයග්‍රහණය කළ සියලු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 40 බැගින් වූ මුදල්

ප්‍රතිපාදනයක් ලබා දී ඇති බව ද ඒ අනුව ගරු සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමාට හා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමාට ලක්ෂ 40 බැගින් ලක්ෂ 120ක් හිමි වන අතර, ඊට අදාල ලිපි මෙම අවස්ථාවේ පිරිනමන බව ද මෙම මුදල් එක්සත් ජාතික පක්ෂයේ ගරු නාගරික මන්ත්‍රීවරුන් 06 දෙනා අතර ලක්ෂ 20 බැගින් බෙදාගෙන අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කරන ලෙස තමන් යෝජනා කරන බව ද පැවසීය.

මෙම අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. පී. වීරසිංහ මැතිතුමා පසුගිය කාලයේ ගැල වූ ඉන්ටලොක් ගල් වලට සිදු කරේ කුමක් දැයි විමසීය.

ඒ සඳහා පිළිතුරු ලබා දුන් ගරු උප සභාපතිතුමා තමන් වැඩ බලන සභාපතිව සිටි කාලයේ දී එම ගල්, ගල්වල තුළ එක්රැස් කර තිබූ නමුත් මේ වන විට කොටසක් අඩු වී ඇති බව තමන් ද දුටු බව පැවසීය. එබැවින් මේ සම්බන්ධව කරුණු විමසීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි එම්. ඩබ්. විමලසිරි මැතිතුමාගේ යෝජනා ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු විමසීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

**07:04 ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

07:04:01 අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් පරිදි මුල් ළමා විය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ දිවයින පුරා ඉදි කෙරෙන ප්‍රමිතියෙන් යුත් පෙර පාසල් 150 න් එක් පෙර පාසලක් බළන්ගොඩ නගර සභා සීමාවට ලබා ගැනීම සඳහා ගරු රත්නපුර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමා හරහා කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල්, ප්‍රාථමික අධ්‍යාපන සහ පාසල් යටිතල පහසුකම් අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කිරීමට ගරු සභාවට යෝජනා කරන අතර, ඒ සඳහා සුදුසු නගර සභාව සතු බිම් කොටසක් ලබා දීමට ද යෝජනා කරමි.

07:04:02 පල්ලෙවෙල මාර්ගයේ සුසිලා මහත්මියගේ නිවස ඉදිරිපිටින් පහළට වැසි ජලය ගලා බසින බෝක්කුව මැදින් කඩා වැටී ඇති නිසා වැසි දිනවල ජලය ගලා බසිනුයේ මාර්ගය හරහාය. ඒ පිළිබඳව කර්මාන්ත කමිටුවේ අවධානය යොමු කර එම බෝක්කුව සහ කාණු කොටස පිළිසකර කර නඩත්තු කිරීම

07:04:03 බුලත්ගම විල්සන් බේකරිය අසලින් පොල්ගස්වත්ත දෙසට ඇති වැසි ජල කාණුවේ අවහිර වී ඇති බෝක්කුව, මඩ ඉවත් කර සුද්ධ කිරීම

ඉහත සඳහන් යෝජනා ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහි දී අදහස් දැක් වූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා, 07:04:01 යෝජනාව සඳහා බළන්ගොඩ නගර සභාවට අයත් බුද්ධ ජයන්ති මාවතේ ඉහළ කොටසේ ඉඩම පෙර

පාසලක් ගොඩ නැගීම සඳහා සුදුසු බවට යෝජනා කර මෙම මස 29 දින පැවැත්වෙන සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

එමෙන්ම 07:04:02 හා 07:04:03 යෝජනා සම්බන්ධව ද අවධානය යොමු කර අවශ්‍ය නඩත්තු සිදු කර දෙන ලෙස පැවසීය.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:05 ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

07:05:01 බළන්ගොඩ, ගොරොක්ගහමඩ සමගි මාවතේ (අක්කර 18) පිවිසුම් මාර්ගය අබලන් වී ඇති බැවින් එය නඩත්තු කිරීම

07:05:02 බළන්ගොඩ, ගොරොක්ගහමඩ එස් එච් මාවත නැවතත් කැඩී යන බැවින් එය නඩත්තු කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**07:06 ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා**

07:06:01 දොරවෙල ප්‍රධාන මාර්ගයේ සිට සුනිල් හඳපාන්ගොඩ මහතාගේ නිවස දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම

ඉහත සඳහන් යෝජනාව ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**08. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

**09. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| පුනරාවර්තන ලැබීම් | **8,302,157.72** |
| වෙනත් ලැබීම් | **1,440,210.27** |
| මුලු ලැබීම් | **9,742,367.99** |
| පුනරාවර්තන වියදම් | **9,240,735.17** |
| වෙනත් වියදම් | **2,819,517.15** |
| මුලු වියදම් | **12,060,252.32** |

**2021-08-01 සිට 2021-08-31 දක්වා ඉන්ධන වියදම්**

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 56-1906 | 27,861.00 |
| 227-5020 | 20,013.00 |
| RD - 8240 | 24,753.00 |
| 226-7521 | 14,119.00 |
| BC-0005 | 33,300.00 |
| GC 0001 | 4,408.00 |
| LL - 7688 | 13,875.00 |
| CSM 0009 | 628.00 |
| DDR 008 | 555.00 |
| DPP 0006 | 7,120.00 |
| RD 8000 | 12,765.00 |
| RB 4786 | 20,421.78 |
| OS 0006 | 20,421.78 |
| SDRRY | 555.00 |
| JD-4684 | 2,056.70 |
| LL-2110 | 10,519.00 |
| ND-5124 | 20,757.00 |
| PF-4006 | 32,997.60 |
| QL-2901 | 3,768.00 |
| RC-1107 | 31,242.40 |
| RE 2600 | 27,640.00 |
| VI 1833 | 1,256.00 |
| RC 1118 | 11,212.00 |
| ZA 9835 | 18,570.00 |
| MG0014 | 19,500.00 |
| OV M 0017 | 1,396.00 |
| ZA 5039 | 60,417.00 |
| **එකතුව** | **441,017.26** |

10. **ඇස්තමේන්තු අනුමත කිරීම**

අද දින කර්මාන්ත නඩත්තුවලට අදාල ඇස්තමේන්තු කිහිපයක් ඉදිරිපත් වී ඇති අතර, ඒ සම්බන්ධව සාකච්ඡා කිරීම සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රි කේ. ජී. පේමදාස මැතිතුමාගේ යෝජනා ස්ථීරත්වයෙන් මහ සභාව කාරක සභාව බවට පත් කරන ලදී.

කරුණු විමසීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාත්වයෙන් හා ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමියගේ ස්ථීරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත් කරන ලදී.

ඒ අනුව ගරු උප සභාපතිතුමන් විසින් මෙම ඇස්තමේන්තු කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර එහි දී සාකච්ඡා කිරීමෙන් අනතුරුව මහ සභාව වෙත ඉදිරිපත් කරන ලෙස යෝජනා කළ අතර, ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා ස්ථීර කරන ලදී.

**විරෝධතා නොවූ හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.**

**11. පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය අදහස් දක්වමින් ප්‍රථමයෙන්ම අසනීප තත්ත්වයෙන් සිටින ගරු සභාපතිතුමාට සහ පවුලේ සියලු දෙනාටම නිදුක් නීරෝගීකම ප්‍රාර්ථනා කරන බව ද නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමියගේ සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝකය මෙම අවස්ථාවේ දී පළ කරන බව ද පවසන ලදී.

තමන් අද දින සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 20 ක් ලබා දෙන ලෙස යෝජනාවක් ගෙන ආවේ සියලු මන්ත්‍රීවරුන් වෙනුවෙන්ම වුව ද එය සම්මත නොවූ බව ද සභාවට පැමිණ අවුරුදු 03 ක් ඉක්මව ඇති අවස්ථාවේ දී මිනිස්සු වෙනුවෙන් සංවර්ධන කටයුතු බොහොමයක් කිරීමට අපේක්ෂා කළ නමුත් එය ඉටු කර ගැනීමට නොහැකි තත්ත්වයක් උදා වී තිබීම පිළිබඳ තමන් අතිශයෙන්ම කණගාටුවට පත් වෙන බව ද තමන් දිගින් දිගටම උඩකන්ද පාර සකස් කර ගැනීම සඳහා යෝජනාව ගෙන ආ අතර තම පක්ෂයෙන් කර ගැනීමට නොහැකි නිසා ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමාට පවා පැවසුව බව ද නමුත් මාර්ගයේ කන්ද වැඩි නිසා කාපට් ඇතිරීමට නොහැකි බව සඳහන් වු බැවින් තමා ගැන සිතා නොව ජනතාව ගැන සිතා කෙසේ හෝ මෙම මාර්ගය සංවර්ධනය කර දෙන ලෙසට මෙහි දී ඉල්ලා සිටින බව ද විශේෂයෙන් මිනිසුන්ගේ තේ දලු පවා ප්‍රවාහනය කිරීමට නොහැකි තත්ත්වයකට අද පත්ව ඇති බව ද පැවසීය. එමෙන්ම තමන් ගරු සභාවට කළ යෝජනාවක් අනුව මාර්ගයේ කාණුව දෙපැත්ත සකස් කර දී ඇති නමුත් කාණුව පස්වලින් ගොඩ වී ඇති අතර කොන්ක්‍රීට් නොදා සෑදීම නිසා කැඩී යන බව ද නිවාස දෙක තුනකම කාණු වසා මාර්ගය සෑදීම නිසා වර්ෂා කාලයේ දී ඉහළ කන්දේ සිට පැමිණෙන වතුර නිසා සම්පූර්ණයෙන්ම මාර්ගය විනාශ වෙමින් පවතින බව ද බළන්ගොඩට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් අවශ්‍ය නිසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට ඡන්දය ලබා දුන් බව බොහෝ පිරිසක් තමන්ට පැවසූ නමුත් මේ වන විට එම පිරිස ගරු මන්ත්‍රීතුමා පිළිබඳ කලකිරීමෙන් සිටින බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය, මෙම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා සියලුම දෙනාගේ සහයෝගය ලබා දෙන ලෙසට මෙම අවස්ථාවේ ඉල්ලා සිටින බව ද පැවසීය. මීට අමතරව තුඹගොඩ පන්සලේ ප්‍රශ්නය සම්බන්ධව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට පැවසූ අවස්ථාවේ දී ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමාට එය මතක් කරන ලෙසට තමන්ට පැවසූ බව ද එම නිසා පන්සලේ ස්වාමින් වහන්සේ සමඟ සාකච්ඡා කර එම ප්‍රශ්නය විසඳා දෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී වසන්ත ගුණරත්න මැතිතුමාගෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටින බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අදහස් දක්වමින් නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය පිළිබඳ බලවත් ශෝකය මෙම අවස්ථාවේ දී පළ කරන බව පැවසීය.

එමෙන්ම මෙම අවස්ථාව වන විට රටේ කොරෝනා එන්නත්කරණ කටයුතු අවසන් අදියරේ සිදු වෙමින් පවතින බව ද ඇතැම් රටවල ජනතාවට එන්නත් ලබා ගැනීමට සිදු වී ඇත්තේ වෙනත් රටකට ගොස් වුවද අපේ රටේ ජනතාවට කිසිඳු භිගයකින් තොරව නොමිලේ එන්නත් මාත්‍රා දෙකම ලබා දීමේ රජයේ වැඩපිළිවෙල අගය කළ යුතු බව ද නොබෝ දිනකින් අවුරුදු 20 ට වැඩි සියලුම දෙනාගේ එන්නත්කරණ

කටයුතු අවසන් වීමට නියමිත අතර වයස අවුරුදු 12 ට වැඩි දරුවන්ට එන්නත් ලබා දීමට නියමිතව පවතින බව ද පවසන ලදී.

මීට අමතරව දරුවන්ගේ අධ්‍යාපන අයිතිය අහිමි කරමින් පවත්වාගෙන යනු ලබන ගරු විදුහල්පති අරගලය පිළිබඳ කණගාටුව පළ කරන අතර, අපේ රටේ අධ්‍යාපනය පිළිබඳව කටයුතු කරන ගරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ අරමුණ වනුයේ ඉදිරි සති කීපය තුල පාසල් ආරම්භ කිරීමට අවස්ථාව සලසා දීම බව ද අධ්‍යාපනය රැක ගැනීම උදෙසා ගනු ලබන ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් සුභ පතන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළ අතර, නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමියගේ සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන ලදී.

එමෙන්ම රට වසා තැබූ කාලයේ දී මිනිස්සු එක්රැස් නොවී තම අවශ්‍යතා ඉටු කරගෙන ගිය අතර එය විය යුතු බව ද නගර සභාවට ආදායම් මාර්ග නොමැති බව පවසමින් සිටිය ද රට වැසූ කාලයේ දී මස් කඩ වැසීම නිසා සභාවට ලැබෙන විශාල මුදලක් අහිමි කරගෙන ඇති බව ද අද වන විට මත්පැන් අලෙවිසැල්, කුකුල් මස් කඩ හා මාලු කඩ විවෘතව පවතින නමුත් හරක් මස් කඩය වසා ඇති බව ද මේ නිසා මස් කඩයෙන් මාසිකව ලැබෙන ලක්ෂ 28 ක ආදායම සභාව අහිමි කරගෙන ඇති බව ද නගර සභාව ඒ ගැන නොසිතා සිටීම තුළ අඛණ්ඩව ලැබීමට තිබූ මෙම අදායම අහිමි වී ඇති බවද පවසන ලදී. මෙම කාලය තුළ අසාධාරණ ලෙස විශාල මුදලකට හරක් මස් අලෙවි කළ පුද්ගලයන් සිටි අතර, සාමාන්‍ය මිනිසුන් මේ නිසා මස් මිල දී ගැනීමේ අපහසුතාවයට පත් වූ බව ද එබැවින් මෙම සියලුම කරුණු ගැන සිතා යම් කිසි වේලාවක් ලබා දී මස් අලෙවියට ඉඩ ලබා දීමට මින් ඉදිරියේ දීවත් අවධානය යොමු කරන ලෙස තමන් ඉල්ලා සිටින බව ද මේ සම්බන්ධව වෙළඳ සංගමයේ සභාපතිතුමාටත් විශේෂ ඉල්ලීමක් කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් ගරු සභාපතිතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කළ අතර, නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමියගේ සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය අධ්‍යාපනය පිළිබඳව කළ කතාවේ දී ඉදිරියේ දී පාසල් විවෘත කරන බව පැවසූ අතර, එසේ විවෘත වන්නේ නම් ඒ ගැන තමන් සතුටු වන බව ද අධ්‍යාපනය ලබන දරුවන් අවුරුදු ගාණක් නිවෙස්වලට කොටු වී සිටින අතර අධ්‍යාපනය එක තැන පල් වී ඇති බව ද දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම නිසා අපේ රටට වැඩ කරන ජනතාවක් නිර්මාණය වීම අඩාල වී ඇති බව ද පවසන ලදී. මීට අමතරව එතුමිය ගරු විදුහල්පති වැටුප් අරගලයට විරුද්ධ බව

පැවසූ අතර, රටේ බඩු මිල වැඩිවෙන ආකාරයට එම ඉල්ලන වැටුප ද ප්‍රමාණවත් නොවන බව තම හැඟීම බව ද දුප්පත් මිනිස්සු කන හැටි දන්නේ අප බව ද තැබැරුම් විවෘත කර අත්‍යාවශ්‍ය කඩ වසා ඇති බව ද මේ නීතිය කුමක් ද යන්නත් විමසා සිටියේ ය.

තවදුරටත් අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, කොට්ඨාසයේ සංවර්ධන කටයුතු සඳහා ලක්ෂ 40 ක් ලබා දෙන බවට ලිපියක් ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා විසින් තමා වෙත ලබා දුන් අතර, ඒ වෙනුවෙන් තම ස්තුතිය සහ සතුට පළ කරන බව ද මෙම මුදලින් හැකි ප්‍රමාණයක් තම සහෝදර මන්ත්‍රීවරුන්ට ද ලබා දී කොට්ඨාසයේ සංවර්ධන කටයුතු කිරීමට අපේක්ෂා කරන බව ද පවසන ලදී.

එමෙන්ම අද ප්‍රවෘත්තියක් දෙස බැලීමේ දී ප්‍රවෘත්තියෙන් ප්‍රවෘත්තිය වෙනස් බව ද ඉන්ධන හා ගෑස් හිඟයන් ඇති වන බව පවසන බව ද අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය කඩා වැටී ඇති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා, ප්‍රපාතයට වැටී ඇති මේ රට ගොඩගැනීම සඳහා හැකි සෑම ශක්තියක්ම උගත් බුද්ධිමත් මන්ත්‍රීවරුන් සියලු දෙනාම යොදවන ලෙස ද ඒ සඳහා සහයෝගය ලබා දෙන ලෙස ද ඉල්ලා සිටිමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමා අදහස් දක්වමින් හේතුවක් නොමැතිව ඵලයක් හට නොගන්නා බැවින් මෙම අවස්ථාවේ ඒ සම්බන්ධව පැහැදිලි කිරීමට තමන් සූදානම් වූ බව ද ගරු නාගරික මන්ත්‍රිනී මංගලිකා ඉලංකෝන් මැතිතුමිය ගුරු විදුහල්පති වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටින බව පැවසූ නමුත් ඔවුන් ඉල්ලා සිටින්නේ වැටුප් විෂමතාවය නිවැරදි කර දෙන ලෙස බව ද රටේ දැනට පවතින වාතාවරණය මත නිහඬව සිටියත් විශ්‍රාම ලැබූ ඇතැම් ගුරු විදුහල්පතිවරුන් ද වෙනම සංවිධානය වී ඉදිරියේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව ද පැවසීය. එමෙන්ම මේ රට වසා තැබූ අවස්ථාවේ දී තමන්ගේ වියදමින් මාර්ගස්ථ ක්‍රමයට අධ්‍යාපනය ලබා දීමට ගුරුවරුන් වෙහෙස වූ අතර, ඔවුන් සඳහා අන්තර්ජාල පහසුකම් වෙනුවෙන් රජයෙන් කිසිදු සහනයක් ලබා නොදුන් නමුත් කොට්ඨාස අධ්‍යාපන නිළධාරින් විසින් ඉගැන්වීම් කටයුතු සම්බන්ධව වාර්තාවක් ඉල්ලා සිටි බව ද මෙම කාලය තුළ වෛද්‍ය නිලධාරී සංගමයේ හා හෙද සේවයේ වැටුප් වැඩිවීමක් ලබා දුන් බැවින් වැටුප් විෂමතාවය ඉවත් කර ගත යුතු බවට ගුරුවරුන් සිතන්නට ඇති බව ද බොහෝ ගුරුවරුන්ට රු. 25,000.00 හා ඊට වැඩි මුදල් ප්‍රමාණයක් තම වැටුපට එකතු විය යුතු බව තමන්ට හමු වූ ගුරුවරුන් කිහිප දෙනෙකු පැවසූ බව ද විශ්‍රාම යාමට ආසන්නයේ සිටින ගුරුවරුන් මේ අතර සිටින බැවින් මෙම අවස්ථාවේ දී මෙම විෂමතාවය ඉවත් නොවුණහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුපට බලපාන බව ද මේ නිසා ගුරු වෘත්තීය සමිති ගණනාවක් එකතු වී වෘත්තීය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වී ඇති බව ද ඒ අතර ආණ්ඩුවට සම්බන්ධ ගුරු වෘත්තීය සමිති සාමාජිකයන් පවා සිටින බව ද පවසන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී කේ. පී. පේමදාස මැතිතුමා, අවුරුදු විසි ගණනක් තිස්සේ පැවති ප්‍රශ්නයක් මෙම වෙලාවේ මතු කරේ ඇයි ද යන්න ඇතැමෙකුට ගැටලුවක් විය හැකි නමුත් මෙතෙක් තිබුණු සියලුම ආණ්ඩු මෙම ප්‍රශ්නය කල් දමමින් සිටි බව ද දරුවන්ගේ අධ්‍යාපන කටයුතු අඩාල වී ඇති බව සත්‍යයක් වන නමුදු වෘත්තීය ක්‍රියාමාර්ගවලට පිවිසීමේ දී එසේ සිදු වන බව ද

වෛද්‍යවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගවල දී පවා රෝගීන් අපහසුතාවයට පත් වූ බව ද මෙවැනි තත්ත්වයන් ඇති වීමේ වගකීම ආණ්ඩුවට පවතින අතර, විෂමතාවය නිවැරදි කරන බව පැවසුව නමුත් ඒ බව ලිඛිතව ලබා නොදී ඇති නිසා මෙම අර්බුදය තවදුරටත් දැඩි විය හැකි බව ද පෙර අවස්ථාවක දී රුපියල් 10,000.00 ක දීමනාවක් ලබා දුන් නමුත් ඊට සාපේක්ෂව මූලික අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා ණය පහසුකම් ලබා ගෙන ඇති බවද මේ වන විට පවතින බඩු මිලත් සමඟ ජීවත්වීමට පවා අපහසු තත්ත්වයකට පත්ව ඇති බැවින් වැටුප් විෂමතාවය ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් සිදු කරන බව ද පැවසීය.

මීට අමතරව බඩු මිල ඉහළ යාම සීඝ්‍රයෙන් සිදු වන අතර, පෙර අවස්ථාවක දී මේ රටට මෙතැනින් ඉදිරියට අඟලක්වත් යාමට නොහැකි බව තමන් පවසා ඇති බව ද මෙම අර්බුද මෙම කාලයේ ඇති වූවක් නොව System එකේ වැරැද්දක් බව ද 1977 වර්ෂයේ ආරම්භ වී ක්‍රමයෙන් පැමිණ අද වන විට අර්බුදයකට පත් වී ඇති බව ද යම් කිසි කෙනෙක් කොරෝනා වසංගතය හේතුවෙන් මම තත්ත්වය ඇති වී ඇති බව පැවසුව ද වසංගතය හමුවේ බංග්ලාදේශය, චීනය ආදී බොහෝ රටවල් ඉදිරියට පැමිණ ඇති බව ද ශ්‍රී ලංකාවේ ඇතැම් මූල්‍ය සමාගම් මෙන්ම ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතා පවා තමන්ට විශාල ලාභයක් මෙම කාලය තුළ ලැබුණු බව පවසා ඇති බව ද මේ නිසා තමන් කිසිවෙකුට දෝෂාරෝපණය නොකරන අතර, ධනවාදී ආර්ථිකයේ ධනේශ්වර අර්බුදය මෙසේ පවතින බව ද පවසන ලදී.

ඒ අනුව මූලික මිනිස් සමාජයෙන් ආරම්භ වී කෘෂිකාර්මික සමාජයකට පැමිණ ඉන් පසු වහල් සමාජය, වැඩවසම් සමාජය, හා ධනවාදී සමාජ ක්‍රමය දක්වා පැමිණ මේ වන විට එහි කාලය අවසන් වෙමින් පවතින අතර මේ සමාජ ක්‍රමය වෙනත් සමාජ ක්‍රමයකට වෙනස් විය යුතු බව ද එම ක්‍රමය සමාජවාදය යැයි අප සිතන බව ද එහි දී මෙම පවතින ක්‍රමයේ යම් යම් වෙනස්කම් සිදු වන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා, මේ වන තෙක් හිටපු ජනාධිපතිවරුන් කිහිපදෙනෙකු නඩත්තු කිරීමට විශාල වියදමක් දරන බව ද නිල නිවාස, කාර්යාල, සේවකයන්, ආරක්ෂකයන් ඇතුලු විශාල පහසුකම් ප්‍රමාණයක් ඔවුන්ට ලබා දී ඇති අතර, එම වියදම් අවශ්‍ය නොවන බව ඔවුන්ට පැවසීමට හැකි වුවත් එසේ නොපවසා සියලු පහසුකම් ලබා ගන්නා බව ද සාමාන්‍ය පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට ආරක්ෂක භටයන් දෙදෙනෙකු ලබා දුන්නත් වර්තමානයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වුව ද රනිල් වික්‍රමසිංහ මැතිතුමා හට ආරක්ෂක භටයන් 200 කගේ ආරක්ෂාවක් ලබා දී ඇති බව තමන් වගකීමෙන් පවසන බව ද මෙවැනි කාරණා හේතුවෙන් රටේ මුදල් විනාශ වන බව ද සඳහන් කළේය. එමෙන්ම අප කුඩා කළ කර්මාන්තශාලා විශාල ප්‍රමාණයක් තිබුණු අතර, හිටපු ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ කර්මාන්තශාලා 48 ක් පුද්ගලික අංශයට ලබා දුන් බව ද හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරණායක මැතිණිය විසින් තවත් විශාල ප්‍රමාණයක් වසා දැමූ බව ද මෙම කර්මාන්තශාලා අඛණ්ඩව පවත්වාගෙන පැමිණියේ නම් අද වන විට විශාල ආදායමක් ලබා ගැනීමට හැකියාව තිබුණු බව ද පසුගිය වකවානුව තුළ මේ රටේ නිෂ්පාදනය කළ හැකි සිමෙන්ති, වානේ, තුනී ලෑලි, කඩදාසි, සීනි කර්මාන්තශාලා හා ඇඟලුම් කර්මාන්තශාලා විනාශ වී ඇති අතර, විශේෂයෙන්ම බළන්ගොඩ පැවති වෝල්ටයිල් කර්මාන්තශාලාව වසා දැමූ බව ද මේ නිසා රටේ විශාල ආදායමක් අහිමි කරගෙන ඇති අතර ඉශල ධනපතියන්ගේ බදු කපා හැරීම් පවා සිදු කළ බව ද දේශපාලනයට සම්බන්ධ ඇතැමුන් හොරකම් සිදු කර ඇති බව ලන්ඩන්හි පළ වූ පුවත්පතක පවා තිබුණු බව ද මේ නිසා ඉදිරියේ දී බරපතල තත්ත්වයක් නිර්මාණය විය හැකි බව ද පවසන ලදී.

මීට අමතරව අපේ රටේ සාම්ප්‍රදායික බීජ වර්ග නොමැති නිසා රසායනික පෙහොර නොමැතිව වගා කිරීම නොහැකි තත්ත්වයක් මතුව තිබෙන අතර, ශ්‍රී ලංකාවේ තේ අස්වැන්න බාගයකින්ම අඩු වී ඇති බව සමීක්ෂණයක දී හෙළි වූ බව ද මීට පෙර අවස්ථාවක තේ කොමසාරිස්ගේ චක්‍රලේඛයක් අනුව ලංකාවට තේ කොළ ආනයනය නොකළ නමුත් පසුව මෙම චක්‍රලේඛය අහෝසි කර චීනය, වියට්නාමය හා ඉන්දියාව වැනි රටවලින් තේ කොළ ආනයනය කර, සිලොමන් ටී නමින් ප්‍රති අපනයනය කරන බව ද ඉදිරියේ දී කඳු රට පවතින විශාල තේ ඉඩම් ප්‍රමාණයක් චීන සමාගම් අතට පත්වෙන බවට අනාවැකියක් තමන් ප්‍රකාශ කරන බව ද වී ගොවියන් පවා අද වන විට අර්බුදයකට ලක්ව ඇති බව ද අවසානයේ ඇමරිකාව,චීනය, ඉන්දියාව හෝ වෙනත් රටක අධිරාජ්‍යවාදී කෙළි මඩලක් බවට අපේ රට පත්වෙන බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී කේ.ජී. පේමදාස මැතිතුමා, වර්තමානයේ පෝට් සිටිය ආශ්‍රිතව විශාල ඉඩම් ප්‍රමාණයක් සමාගමක් හරහා විදේශිකයන්ට ලබා දීමට සූදානමක් පවතින අතර, මෑතක දී අක්කර 13 ක් වූ වරාය ඉඩම් ලබා දීමට සූදානම් කර තිබූ බව ද විදුලි බල මණ්ඩලයේ 40% ක කොටසක් රාත්‍රී 12.06 ට ගිවිසුම් අත්සන් කර ඇමරිකානු සමාගමට ලබා දී ඇති අතර, මේ සම්බන්ධව විෂයභාර ඇමතිවරයා පවා දැනුවත්ව නොසිටි බව ද සියලුම කටයුතු අවසන් කර කැබිනට් පත්‍රිකාව යොමු කර ඇති බව ද මේ සම්බන්ධව ඉදිරියේ දී දැඩි අර්බුද පැන නැඟිය හැකි බව ද මහා පරාක්‍රම සමුද්‍රය කපා ඇවිදින මංතීරු ඉදි කිරීමේ සිද්ධියේ දී ද හිටපු ජනාධිපතිතුමාගෙන් පවා විරෝධතාවයක් පැමිණි බව ද මෙවැනි අවිධිමත් ක්‍රියාකාරකම් නිසා අතුරු ප්‍රශ්න ගොඩ නැගී ඇති බව ද මේ නිසා සාමාන්‍ය මිනිස්සු පීඩාවට පත්ව ඇති බව ද පවසන ලදී. එමෙන්ම ලෝකයේ ප්‍රධාන පෙළේ රටවල් අතර ආර්ථික යුද්ධයක් පවතින අතර, ඇමරිකාව හා චීනය අතර එවැනි ගැටලුවක් ඇති වුවහොත් අපට පවා මැරුම් කෑමට සිදු විය හැකි බව ද අර්බුදයන් උග්‍රවන සෑම මොහොතක දීම ආණ්ඩුවේ සිටින ද්විත්ව පුරවැසිකම් ලැබූ අය තමන්ගේ රටවලට යන බව ද 2015 මැතිවරණ පරාජයේ දී පවා එසේ සිදු වූ බව ද රටේ ප්‍රශ්නයක් ඇති වූ විට පක්ෂ භේදයකින් තොරව සියලුම දෙනාට එය බලපාන බව ද බඩු මිල ඇතුලු සියලුම දේ ඉහළ යමින් පවතින බව ද වැඩිදුරටත් පැවසීය.

මීට අමතරව නගර සභාවේ ලේකම්තුමියේ ස්වාමි පුරුෂයාගේ අභාවය සම්බන්ධව පවුලේ සියලුම දෙනාට තම කණගාටුව ප්‍රකාශ කරන බව පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා හේතුවක් නැතිව එලයක් හට නොගන්නා බව පැවසූ අතර, එය ඉතා හොඳ ප්‍රකාශයක් බවත්, අප රටක් වශයෙන් ගෝලීය වසංගතයකට මුහුණ දෙන බවත්, රටේ තත්ත්වය කතා කිරීමට පෙර සභාවේ තත්ත්වය ගැන පැහැදිලි කළහොත් මේ වන විට සභාවේ සියලුම ආදායම් අඩාල වී ඇති නමුත් සෞඛ්‍ය සේවා ඇතුලු අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යන බවත්, රටක් වශයෙන් ගත් කළ රටේ තත්ත්වයත් එසේම වන අතර, ආදායම නොමැතිව සියලු ක්ෂේත්‍ර පවත්වා ගෙන යන බවත් පවසන ලදී.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී කේ. ජී. පේමදාස මැතිතුමා සිදු කළ කතාවේ දී පැවසූ පරිදි නිෂ්පාදන ආර්ථිකයක් සකස් කර නොගැනීම තුළ ආනයන අපනයන පාලනය නිසා යම් යම් උච්චාවචනයන් සිදු වන බව ද මේ සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මුහුණ දීමට සිදු වීම කරුමයක් බව ද නිදහසින් පසු අවුරුදු 72ක දේශපාලන ඉතිහාසයට වෛර කරන පරම්පරාවක් නිර්මාණය කිරීමට

උත්සාහ කළ ද නිදහසින් අවුරුදු 29 කට පසු 1977 වර්ෂයේ මෙම කාලකණ්නි ක්‍රමය ඇති වූ බව ද ශ්‍රී ලංකාවේ ස්වර්ණමය යුගය සිරිමාවෝ බණ්ඩාරණායක යුගය බව ද එවක එතුමියගේ පාලනයට විරුද්ධව කැරැලි ගසා පාලනය බිඳ දැමූ වැඩිහිටියන්ගේ තුන්වන පරම්පරාව එතුමියගේ පාලන ක්‍රමය තිබුණේ නම් අද අපි මෙතන නෙවෙයි ඉන්නේ යැයි පවසන බව ද නිදහසින් පසු අවුරුදු 29ක් වෙද්දී අපේ රටට නැව් 05ක් තිබුණු නමුත් අවුරුදු 72 කට පසුව අපට තිබෙන්නේ මොනවාදැයි පැවසූ ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා මේ රටට ආදරය කරන යහපත් තීන්දු තීරණ ගන්නා නායකයන් නිසි අවස්ථාවේ පත් කර නොගත් බව ද හිටපු ජනාධිපති ජේ ආර් ජයවර්ධන මැතිතුමා 1977 විවෘත ආර්ථිකය ඇති නොකළේ නම් මේ වසංගතය හමුවේ වුව ද ඕනෑම රටකට අභියෝග කළ හැකි තත්ත්වයක අප රට පැවතිය හැකිව තිබූ බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් ලංකා විදුලි බල මණ්ඩලයේ කෙරවලපිටිය බලාගාර සිද්ධියේ දී තමන් රජය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හා විදුලි බල මණ්ඩලයේ සේවකයෙක් වශයෙන් එම ගත්තා වූ තීන්දුව වැරදි බවට ප්‍රකාශ කරන අතර, ආණ්ඩුව ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නමුත් වැරදි තීරණයක් ගන්නේ නම් එය වැරදි බව කොන්ද කෙළින් තබාගෙන පැවසීමට සූදානම් බව ද මේ සම්බන්ධව ඉදිරියේ දී ලංකා විදුලි බල මණ්ඩලයේ සේවකයෙක් වශයෙන් විදුලි බල මණ්ඩලය විසින් ගනු ලබන ඕනෑම අරගලයකට ඉදිරිපත් වන බව ද අපට අවශ්‍ය වන්නේ ආණ්ඩුව ආරක්ෂා කරගෙන මෙම ගත්තා වූ තීන්දුව නිවැරදි මගට ගෙන ඒම බව ද  ලෝක බැංකු ආධාර යටතේ කෙරවලපිටිය බලාගාරය  ඉදිකර අතර, මහ බැංකුව සතුව තිබෙන 60%ක් වූ කොටස්වලින් 40% ක් අවුරුදු 15 ක ගිවිසුමකට මෙසේ පවරා ඇති බව ද තව අවුරුදු 15කින් පසු ගිවිසුම් ප්‍රකාරව කෙරවලපිටිය බලාගාරය රජයට අයිති දේපලක් වන නිසා නැවත වතාවක් ඒක ගිවිසුමකට බද්ධ කිරීම සම්බන්ධව විරුද්ධ බව ද පැවසීය.

එමෙන්ම හම්බන්තොට වරායේ 80%ක් වූ කොටස් අවුරුදු 200 කට පවරා දෙන අවස්ථාවේ ඒ ගැන වචනයක් කතා නොකළ අය අද මෙම සිද්ධියේ දී කෑ ගසන බව ද වැරදි දේ කවුරු කළත් වැරැදි බව ද අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ තාක් නිවැරදි තීරණ ගත් අතර, මෙම වසංගතය හමුවේ ආර්ථිකය පාලනය කර ගනිමින් ජනතාව ආරක්ෂා කර ගනිමින් කටයුතු කරන බව ද ගත්තා වූ එකම වැරදි තීන්දුව මෙය බව ද ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා දරුවො හදන්න එපා කිව්වා යැයි සිනාසෙමින් පැවසුව ද එසේ පවසා ඇත්තේ දරුවන්ට ඇති ජීවිත අවදානම පිළිබඳව නිසාවෙන් බැවින් එය තේරුම් ගන්නැයි ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මේ සඳහා පිළිතුරු ලබා දුන් ගරු නාගරික මන්ත්‍රී එම්. ඩබ්. විමලසිරි මැතිතුමා එම කියමන තමා පැවසූ දෙයක් නොව රජයේ විශේෂඥ වෛද්‍යවරුන් කළ ඉල්ලීමක්  බව පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රිනි පී. චන්ද්‍රලතා මැතිතුමිය අදහස් දක්වමින් නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමියගේ සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන ලදී.

එමෙන්ම වත්මන් රජය හැට නව ලක්ෂයක් වූ ජනතාවක් විසින් පත් කළ පසු කෙරෝනා වසංගතය පැමිණීම නිසා අපේ රටේ ආර්ථිකයට බලපෑම් ඇති වූ බව ද අනෙකුත් රටවල් හා සැසඳීමේ දී එන්නත්කරණය 50% ඉක්මවා ලබා දී ඇති අතර, ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ අරමුණ වන්නේ මෙම වසංගතය තුරන් කර රටේ ආර්ථිකය නගා සිටුවීම බව ද රජය මෙතරම් බරක් කර දරා ගනිමින් ආර්ථිකය යම් තරමකට හෝ ගොඩනගා ගෙන යන මෙම ගමන සම්බන්ධයෙන් සතුටු බව ද රජය මඟින් හොඳ දෙයක් කළ ද වැරදි ලෙස බොහෝ දෙනා දකින බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රිනී පී. චන්ද්‍රලතා මැතිතුමිය, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පයක් මත කාබනික පොහොර ප්‍රචලිත කිරීම ආරම්භ වූ අතර, බිම් මට්ටමින් ඒ පිළිබඳව ජනතාව දැනුවත් කරමින් යන අවස්ථාවේ තම කොට්ඨාසය සම්බන්ධව කරුණක් ප්‍රකාශ කිරීමට ඇති  බව ද පැවසීය. ඒ අනුව මීට පෙර අවස්ථාවක දී තමන් පීරිස් මහතාගේ නඩුවක් පිළිබඳව සභාවේ පැවසුව අතර, ඔහුගේ ක්‍රියා කලාපයන් නිසා මාර්ගයට පමණක් නොව කෘෂිකර්මාන්තයටත් අවදානමක් ඇති වී ඇති බව ද ඔහුගේ නිවස ඉදිරිපිට බෝක්කුව මහජන සුබ සිද්ධිය සඳහා සුද්ධ කරන්නැයි තීන්දුවක් නගර සභාවට ලබා දුන් නමුත් අද වනතුරු එය සුද්ධ කර නොමැති බව ද අඩි තුනක පාර මාගේ ඉල්ලීම මත නගර සභාවේ නිළධාරීන් විසින් සුද්ධ කිරීමට කටයුතු කර තිබීම සම්බන්ධයෙන් මෙම අවස්ථාවේ ස්තුතිවන්ත වන බව ද පීරිස් මහතා තම බලය යොදවා තවමත් කටයුතු කරන බැවින් එය අධිකරණයට පවා අපහාසයක් බව ද දැනට අක්කර දෙක හමාරක් මෙම වාතාවරණය නිසා අතහැරී ඇති අතර, බෝක්කුව හා කාණුව සුද්ධ කර දෙන්නේ නම් අක්කර දෙක හමාරක් වූ භූමිය වගා කිරීමට හැකියාව ලැබෙන බවද මේ සම්බන්ධව සාකච්ඡා කිරීමට ඉදිරියේ දී කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් බළන්ගොඩ නගර සභාවට පැමිණිය හැකි බව ද දැඩි අවධානයක් යොමු කර මෙය ඉටු කර දෙන ලෙස ද පවසන ලදී.

මීට අමතරව කොරෝනා වැළඳී සනීප වූ බොහෝ පිරිසක් හුණුකුඹුරේ සිටින අතර, නිවෙස් විෂබීජහරණය කර දෙන්නැයි ඔවුන්ගේ දැඩි ඉල්ලීමක් පවතින බව ද එය අපහසු දෙයක් බව තමන් දන්නා නමුත් අඩු ආදායම්ලාභී ඇතැම් නිවාසවල මීදුල්වලින් නිවාස 5කට 6කට යන අතර, එවැනි ස්ථාන මෙම කොට්ඨාසයේ පමණක් නොව බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේම පවතින බව ද ඔවුන් මුදල් ගෙවා විෂබීජහරණය කර ගත නොහැකි ජනතාවක් බැවින් හැකියාවක් ඇත්නම් එය ඉටු කර දෙන ලෙස ද පැවසීය.

එමෙන්ම ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය උඩකන්ද පාර පිළිබඳව පැවසූ අතර, එතුමිය පැවසූ දෙය සත්‍යයක් බව ද අප පක්ෂයෙන් විපක්ෂයට අද දින සංවර්ධන කටයුතු සඳහා මුදල් ලබා දුන් අතර, ඉන් යම් මුදලක් එම මාර්ගය සංවර්ධනය වෙනුවෙන් එතුමියට ලබා දෙන ලෙස යෝජනාවක් මෙම අවස්ථාවේ සිදු කරන බව ද පවසමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා අදහස් දක්වමින් නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය හා ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරිතුමියගේ සහෝදරයාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන ලදී.

එමෙන්ම නගර සභාවේ සැනිටයිසර්, ලයිෆ්බෝයි, එතනෝල් ලොරි ගණන් ගෙනාව නමුත් කොරෝනා වසංගතයෙන් ගරු සභාපතිතුමා බේරා ගැනීමට බැරි වූ බව ද ඒ ගැන කණගාටු වන බව ද කෙදිනකවත් නොවූ පරිදි ගංවතුරෙන් මේ නගරය යට වූ අතර පාලම දක්වා ගඟ දෙපස සුද්ධ කිරීම පමණක් අද වන විට සිදු කර ඇති නමුත් පිළියම එය නොවන බව ද එම ස්ථානයෙන් පහළ ප්‍රදේශය පිළිබඳව අවධානය යොමු කළ යුතු බව ද නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කතා කළ අවස්ථාවේ දී ඔවුන් එය සකස් කර දීමට පොරොන්දු වූ බව ද මේ සම්බන්ධව නගර සභාව උනන්දුවක් නොදක්වා ඇති අතර වෙළඳ සංගමයේ සභාපති වශයෙන් තමන්ගෙන් ව්‍යාපාරිකයන් නිතර ප්‍රශ්න කරන බව ද ඒ අනුව තමන් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී අකිල එල්ලාවල මැතිතුමාට මෙම ගැටලුව පැවසූ අවස්ථාවේ දී එතුමා ඒ බව ගරු අමාත්‍යතුමාට යොමු කර පිටපතක් තමාට එවා ඇති බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, අප හට කැළණි පාලම යට ඉන්නව වගේ ඉන්න සිදු වී ඇති බව ද මේ සම්බන්ධව ඔබතුමන්ලා මීට වඩා උනන්දු විය යුතු බව ද නැවත වතාවක් ගංවතුරට යටවීමක් සිදු වුවහොත් අලාභහානි වැඩිවිය හැකි බවද වැඩිදුරටත් පවසන ලදී.

මීට අමතරව මහජන ක්‍රීඩාංගනය මාර්ගය වාහනයක් යාමට නොහැකි මට්ටමට අබලන් වී ඇති අතර, වාහන අඩු මෙම කාලය තුළ එය නඩත්තු කර දෙන ලෙස ද අද දින ජල සම්පත් මණ්ඩලයෙන් අවසර ලබා ගත් නමුත් දින 10කට පෙර සිට වීරසුන්දරාරාම මාවතේ මාර්ගය විනාශ කර ඇති බව ද මේ සම්බන්ධව ඔවුන් සමග සාකච්ඡා කර පිළියම් යොදන ලෙස ද පැවසීය.

එමෙන්ම හිටපු ගරු සභාපතිතුමා වීථි පහන් නඩත්තු කිරීම ඉතා හොඳින් සිදු කළ නමුත් අද වන විට ප්‍රධාන වීදියෙ පොලිසිය අසල සහ තානායම් පිවිසුම් පාරට හැරෙන හංදියේ පමණක් වීථි පහන් දැල්වෙන අතර අනිකුත් සියල්ල අක්‍රිය වී ඇති බව ද මේ ගැන සොයා බලන ලෙස ද පවසන ලදී.

තවදුරටත් අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී. වීරසිංහ මැතිතුමිය පැවසූ උඩකන්ද පාර හා සිටි ගාර්ඩ්න් පාර කාපට් ව්‍යාපෘතිය සඳහා තමන් ඇතුලත් කර තිබූ අතර, මාර්ග සංවර්ධන අධිකාරියේ තාක්ෂණික නිළධාරීන් අදාල ස්ථානයන් නිරීක්ෂණය කර මෙම මාර්ග දෙක හැර අනෙකුත් මාර්ග අනුමත කළ බව ද මෙම මාර්ග ප්‍රතික්ෂේප වීමට හේතුව වූයේ දැඩි බෑවුම් සහිත වීම බව ද කාපට් ඇතිරීම නොව වෙනත් ක්‍රමයකින් සංවර්ධනය කිරීමට සිදු වන බව ද පැවසීය.

එමෙන්ම අපගේ රජය මඟින් සංවර්ධන කටයුතු වෙනුවෙන් ගරු මන්ත්‍රීවරුන් වෙත රුපියල් ලක්ෂ 40 බැගින් ප්‍රදානය කිරීම සම්බන්ධව ඉතාමත්ම සතුටු බව ද විපක්ෂයට ලක්ෂ 120 ක් ලැබුණු අතර, එම මුදලින් අවශ්‍ය වැඩ කටයුතු සිදු කර ගන්නා ලෙස ද කොරෝනා මාරයා සමඟ සටන් කරමින් අප සැම සිටින බව අමතක නොකරන ලෙස ද සියල්ලටම පෙර එයින් බේරී සිටිය යුතු අතර, ප්‍රශ්න කිරීමට පෙර ප්‍රශ්නයේ මුල සොයා ඊට පිළියම් යොදන්නේ නම් හොඳ බව ද පැවසූ ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා, ඇමරිකාව, රුසියාව වැනි රටවලට බැරි උන එන්නත්කරණය ඉතා හොඳින් මෙම රජයෙන් සිදු කරන අතර, එය අගය කළ යුතු බව ද කොරෝනා සමයක ඉන්නා බව මතකයේ තබා ගනිමින් ඉදිරි වැඩ කරමුයි ප්‍රාර්ථනා කරමින් අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් නගර සභාවේ ලේකම්තුමියගේ ස්වාමි පුරුෂයාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කළ අතර, එය දැනගත් මොහොතේ මෙතුමියට කතා කර නිවසට යාමට ඇසූ නමුත් සියලුම වැඩ අවසන්ව ඇති නිසා පැමිණීම අවශ්‍ය නොවන බව පැවසූ බව ද ගරු සභාපතිතුමා විසින් අවශ්‍ය කටයුතු සිදු කර තිබූ බව ද එම මරණය කොරෝනා මරණයක් නොවුන ද අවසන් කටයුතු සිදු කරන ස්ථානයේ ගරු උපසභාපතිතුමා හා අප මන්ත්‍රීවරුන් 03 දෙනෙක් පමණක් සිටිය බැවින් කොරෝනා මරණයක ස්වභාවය ගෙන තිබූ බව ද නගර සභාවේ නිළධාරීන් ඇතැම් විට කතා කරන්නට ඇති නමුත් එම අවස්ථාවේ අප 04 දෙනා පමණක් සහභාගී වූ බව ද ඒ සම්බන්ධව ලැජ්ජාවට පත්වෙන බවද එතුමිය සභාවේ අවුරුදු විස්සක පමණ කාලයක් විශාල සේවයක් කළ අතර, මෙවැනි අවස්ථාවක මීට වඩා අපගේ සාමූහික හැඟීම තිබිය යුතු බව තමන්ගේ විශ්වාසය බව ද පැවසීය.

එමෙන්ම අද දිනයේ ගරු මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා බළන්ගොඩ නගර සභාවේ නියෝජිතයා වශයෙන් කොළඹ රැස්වීම්වලට තමා කැඳවූ බවත්, එම අවස්ථාවේ දී පක්ෂ භේදයකින් තොරව සියලුම දෙනාට උදව් කළ යුතු බව පවසා පළාත් පාලන ආයතන ගරු සභිකයන් සඳහා මුදල් ප්‍රතිපාදන ලබා දුන් බවත්, මෙම අවස්ථාවේ ලබා දුන් පෝරමයේ "මහජන නියෝජිතයන්ගේ යෝජනා 2022 අයවැය" නමින් සඳහන්ව ඇති නිසා ඒ සඳහා කිසිවෙකුටත් අත පොවන්නට නොහැකි බවත්, විපක්ෂය සඳහා ලක්ෂ 120 ක් තිබෙන අතර, එය නිවැරදිව ප්‍රයෝජනයට ගෙන අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කරන ලෙසත් ඡන්දයේ දී බෙදී තරඟ කළ ද සංවර්ධනයේ දී ජනතාවට අසාධාරණයක් නොවන පරිදි කටයුතු කරමු යැයි ද පවසන ලදී.

මීට අමතරව ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන ක්‍රමය මෙම රටට ගැලපෙනවා ද යන්න ප්‍රශ්නයක් බව ද මෙය එංගලන්තයෙන් ලැබුණු අතර, ඔවුන් මෙම ක්‍රමය සකස් කර ඇත්තේ කියවන්න, ලියන්න, ගණන් එකතු කරන්න (3 R System) වශයෙන් වන බව ද මෙමඟින් විෂය දැනුම පමණක් ලැබෙන බැවින් මෙම ක්‍රමය වෙනස් කර, Smart කළ යුතු බව ද එය නායකත්වය, සාමූහික බව, නිර්මාණාත්මක බව හා විද්‍යුත් තාක්ෂණය ආදියෙන් යුක්ත විය යුතු අතර, එසේ නොකර කිසිවෙකුටත් දොස් කීමෙන් ඵලක් නැති බව ද තමන් පවසන්නේ වැටුප් විෂමතාවය සම්බන්ධව නොවන බව ද පැවසීය.

එමෙන්ම ලෝකයේ ජනගහනය බිලියන 02 කට වැඩි දියුණු රටවල් 10 ක් ගත් විට ශ්‍රී ලංකාව නව වන ස්ථානයේ සිටින බව ද එම රටවල් 10 තුළ කොරෝනා එන්නත නිෂ්පාදනය කරන රටවල් 07ක් සිටින නමුත් අප විසින් එන්නත් මිල දී ගෙන ලෝකයේ එන්නත්කරණයෙන් පළමු හා දෙවන ස්ථානවල සිටින බව ද එය සතුටුදායක තත්ත්වයක් බව ද රත්නපුර දිස්ත්‍රික්කයේ විශාලම කොට්ඨාසය වන රත්නපුර නගර කොට්ඨාසයෙහි 7000 ක ජනගහනයක් සිටින අතර දෙවැනි ස්ථානය වන්නේ බළන්ගොඩ තුඹගොඩ කොට්ඨාසය ද බව ද එහි ජනගහනය 6127 ක් වන බව ද එහි එන්නත් ලබා ගත් අවුරුදු 60 ට වැඩි පිරිසෙන් 09 දෙනෙකු මිය ගොස් ඇති බව ද අප තවමත් රතු කලාපයේ අවදානම් තත්ත්වයක් තුළ සිටින බව අමතක නොකර වසංගතයෙන් පරිස්සම් විය යුතු බව ද පවසන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා තවදුරටත් අදහස් දක්වමින් කෙරවලපිටිය බලාගාරය සම්බන්ධව තීන්දුවට තමන් එකඟ නොවන අතර, විනිවිදභාවයෙන් තොරව සිදු කරන වැඩ

කටයුතු සඳහා අකමැති බව ද කොරෝනාව වසන්තයක් කරගෙන මුදල් උපයන බොහෝ පිරිසක් සිටින බව ද අප කුඩා දේශපාලකයන් වුව ද උසස් ප්‍රතිපත්ති තිබෙන මන්ත්‍රීවරු සමඟ සිටින බව ද පවසමින් ඉදිරියේ දී සංවර්ධන කටයුතු කරගෙන යාමට හැකි වාතාවරණයක් ඇතිවේවා යි ප්‍රාර්ථනා කරමින් තම අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**12. අවසානය**

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් පැවසුවේ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා පැවසූ මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සම්බන්ධව කරුණු කිහිපයක් තමන් ද මෙහි දී එක් කරන බවයි.

ඒ අනුව 2020 වර්ෂයේ අයවැය තුළින් එක් කොට්ඨාසයකට ලක්ෂ 30 බැගින් ප්‍රතිපාදන ලබා දුන් අතර, මෙවර පක්ෂ භේදයකින් තොරව ශ්‍රී ලංකාවේ සියලුම පළාත් පාලන ආයතනවල කොට්ඨාස ජයග්‍රහණය කළ ගරු මන්ත්‍රීවරුන්ට ලක්ෂ 40 ක් ලබා දී තිබෙන බව ද එය ලබා දෙන්නේ 2022 වර්ෂයේ ඒ ඒ කොට්ඨාසයන් සංවර්ධනය කිරීමට බව ද පක්ෂ භේදයකින් තොරව සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ද මිලියන 100 බැගින් ලබා දී ඇති අතර, ඒ අනුව බළන්ගොඩ සඳහා මිලියන 300 ක් හිමිවන බව ද පැවසීය. ඒ ආකාරයෙන් බැලීමේ දී උතුරු නැගෙනහිර ආණ්ඩුවට එරෙහි පක්ෂ 90% ක් සඳහා මෙම මුදල හිමි වන බව ද වැඩිදුරටත් පවසන ලදී.

එමෙන්ම බළන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ කොට්ඨාස 10න් 07 ක්ම පොදු ජන පෙරමුණ ජයග්‍රහණය කළ බැවින් එම කොට්ඨාස 07 හි ගරු නාගරික මන්ත්‍රීවරුන් එකතු වී සාකච්ඡා කර ඉතිරි කොට්ඨාස 03 හි ද සංවර්ධනය සිදු කිරීමට හැකි බව පැවසූ ගරු උප සභාපතිතුමා, එක්සත් ජාතික පක්ෂය කොට්ඨාස 03 ක් ජයග්‍රහණය කළ අතර එම පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන් 06 දෙනෙකු සිටින බැවින් සාකච්ඡා කර සියලුම දෙනා සමඟ එම මුදල බෙදා ගනිමින් අවශ්‍ය සංවර්ධනයන් තම කොට්ඨාස තුළ සිදු කළ හැකි බව පැවසීය.

අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනීමට සහභාගි වූ ගරු මන්ත්‍රී මණ්ඩලය, ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදීන් සියලු දෙනාට ස්තුතිය පළ කළ අතර, කොරෝනා වසංගතයෙන් සියලුම දෙනා ආරක්ෂා වන ලෙස පවසමින් මෙදින මහ සභාවේ වැඩ කටයුතු ප.ව.1.45ට පමණ අවසන් කරන ලදී.

එම්. ටී. එම්. රුමි,
උප සභාපති,
බළන්ගොඩ නගර සභාව.